මුල් පිටුවට පිවිසීමට මතෙන click කරන්න

ඔබ මාරයාව තැතිගන්වන්න...

මේ සෝර, කටුක, භයානක සංසාරයේ හිය දැක, මේ ආත්මභාවයේම සසර දුකින් එතරෙ වීමට අධිෂ්ඨාන කරමින්, වීර්ය වඩමින්, නිවන් මග පුරන, "දක්ෂ", ගිහි පැවිදි උතුමන්ට පමණක් මේ අහිංසක ඒයයාමය උපකාරයක්ම වේවා! ශක්තියක්ම වේවා! මාර්ගයක්ම වේවා! තම තමන්ට වැටහනෙ ප්‍රමාණයට තම තමන්ගෙ ජීවිත වලට ගලපාගනිත්වා!
අර්ථ හෝ ව්‍යාකරණ වැරදි ඇතොත් ඔබ නොකළ වරදකට ඔබ නොගැටේවා! අනුනටද අනුකම්පා කරේවා! වැරදි නැතොත් නිවැරදි දයෙ නිවැරදි ලසෙ දකිවා! මහි සටහන් හැම අර්ථයක් තුළින්ම ඔබ සැමට යහපතක් වේවා! තමා තමාටම පිහිටකොට ගනිත්වා.." යැයි උන්වහන්සේ ඒ පොත් පළෙ ඇරඹුමේ ලියා ඇත්තාහ.

මේ ජීවිතය තුළදීම නිවීම සාක්ෂාත් කරගැනීම සඳහා වහෙසෙනෙ භික්ෂුවකට නිදහස් පරිසරය අත්‍යවශ්‍යය. නිදහසට එක අර්ථයක් දිය නොහැක. ලෞකික. ලෝකෝත්තර වුවමනාවන් අනුව නිදහසේ අර්ථය වනෙස් වයෙ. කනෙකේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය, ගුරු පත්වීම්, රජයේ රැකියාව, දේශපාලනය නිදහස ලසෙ දකියි. මේ කිසිත් වරදක් නොවේ. ඒ තම තමන්ගෙ දෘෂ්ටිය. එහනේ ඒ ලොව්තුරා නිර්වාණ ප්‍රතිපදාව නොවේ. මහි සඳහන් කරුණු අදාළ වන්නේ ශාසනයේ හික්මනෙ ළමා තරුණ භික්ෂූන් වහන්සේලා හට නොව, ජීවිතාවබෝධයෙන් ලෞකික සම්පත් දුක බව දැක, මේ සියල්ල තුළින් රැස්වන්නේ දුකම බව දැක, ගිහිබැම්වලින් වචනයේ පරිසමාප්ත අර්ථයනේම මිදීමේ ජීවිතයේදීම නිවීම සාක්ෂාත් කරගැනීමට ප්‍රතිපදාවේ යදෙනෙ වීර්යවන්තයන්ටය. මවැනි සත් පුරුෂයන් විශාල පිරිසක් මේ ශාසනයේ සිටින බව සත්‍යයකි. ඒ මග යන්න ඔබ රුචිනම්

ඔබටද මග විවෘතය. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ඔබට නිවැරදි මග කියාදී ඇත. නිදහස අර්ථවත් වීමට ඔබ මසෙේ සිතිය යුතුය. මා පැවිදි වූයේ අනුනට බණ කිමට, පිරිත් කිමට, පන්සල් ආරණ්‍ය පාලනය කිරීමට, නායක හිමිනමකගේ ඒළඟ උරුමක්කාරයා වීමට නොව, දිව්‍ය බ්‍රහ්ම සංඥ වැඩීවීමට නොව මේ ආත්මයේදීම නිවන් මග පරිපූර්ණ කරගැනීමට බව සිතීමට ඔබට ශක්තිය තිබිය යුතුය. ලොව්තුරා බුදු වදනට අනුව නිදහස යනු මසෙේ සිතන්නට හැකිවීමයි. මාරයාගේ ධර්මය අනුව නිදහස යනු මීට විරුද්ධය සිතීමයි.

බුදු පුතකු ලසෙ මුලින්ම ඔබට නිවීම ඇත්තේ බුදුරජාණන් වහන්සේ ළඟවත්, පිරිත් පොතේ, ත්‍රිපිටකයේ හෝ නොව තමා තුළම බව සිතිය යුතුය. ඉහත කිසිවක් තුළ නිවීම නොමැත. දැනුම, ආදර්ශ, මාර්ගය ඉහත කරුණු කාරණා තුළ ඇත. ඒ ගැන තර්කයක් නොමැත. ඔබ ධර්මය ඉගනේමට පොතපතට යොමු වුවහොත් ඒළඟට සිදුවන්නේ දැනුම, පණ්ඩිතභාවය වැඩිවී ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා පැවැත්වීමට යැමය. එසේ නොමැති නම් මිහිරි ස්වරයනේ බුදුමැදුරට, බෝ මළුවට කොටුවී පූජාවන් පැවැත්වීමටය. ගිහි දායකයෝ මේවාට ඉතා ප්‍රියයි. භික්ෂූන්වහන්සේටද ලැබනෙ ලකුණු, ජනප්‍රියභාවය, සැලකිලි ඉහළය. දපොර්ශවයටම වැඩනේනේ ලෞකික කලෙසේ ධර්මයන්ය. ඒවා සංසාරික සැප පිණිස හේතුවේ. අවසානයේ සියලු දේ අතහැර පැවිදිවූ හාමුදුරුවෝ දායක පිංවතුන් සතුටු කරන රූකඩයකි.

මහිදී ඔබ දක්ෂ විය යුතුයි සියල්ල අතහැරීමට. හැබැයි ඔබට වඩා දක්ෂ මාර්ගය වැඩූ කල්‍යාණ මිත්‍රයන් ඔබ ආශ්‍රය කළ යුතුය. ඔබ එය මගහරින්න එපා, ඔබ ශක්තිමත් තැනකට එනතුරාවට, නිරතුරුවම ඔබ ඉදිරියේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වැඩ සිටින බව, සැරියුත් මහෝත්තමයන්, මුගලන් මහෝත්තමයන් ඔබ ඉදිරියේ වැඩ සිටින බව, ඔබට අවවාද දනෙ බව ඔබ සිතන්න, දකින්න, මීට වඩා ආරක්ෂාවක් අවශ්‍ය නෑ ඔබට.මමෙ ගමනේදී, ඔබට හැමෝම කියාවී රැස්කරන්න කියලා. මොනවද? දැනුම, ගාථා පිරිත්, සූත්‍ර, අභිධර්ම, බණ... මේ

සියල්ල ඔබ අතහරින්න, ඔබ සැහැල්ලුවන්න. හැම බරකින්ම නිදහස්වන්න උත්සාහ ගන්න. නිවීම කියන්නේ මහෙයුමක්. මේ මහෙයුමට ඔබට අවශ්‍ය වන්නේ තුන් සිවුරත්, පාත්‍රයත්, හුදකෙලා වන කුටියත් පමණයි. ඔබ ශීලයනේ සමාධියනේ පරිපූර්ණ බවට පත්ව ඇති බව ඔබට විශ්වාසනම්, ඔබගේ ශීලය ගැන ඔබට කුකුසක් නොමැතිනම්, වනයේ හුදකෙලා කුටියක් නෝරාගැනීමට ඔබ සුදුස්සකේ. ඔබගේ ශීලය ගැන ඔබට විශ්වාසයක් නොමැතිනම් වනයේ කුටියක හුදකෙලා වීමට ඉක්මන් නොවිය යුතුය. ඔබ ශක්තිමත් නොවීම මාරයාට ගොදුරකි. වනයේදී ගල්කුටියේදී අමනුෂ්‍යයන් ඔබව වහලකේ, රෝගියෙක්, මානසික ලඩෙකේ කරනු ඇත. ඔබ පසුබට නොවන්න. මගවැඩූ කල්‍යාණ මිත්‍රයකුට කටේ කමටහන් කිහිපයකින් ඔබව ශක්තිමත් කිරීමට හැකියාව ඇත. මහිඳි ශීලය යනු ඔබ සාමණේරද, උපසම්පදාද, මොන නායක ස්වාමීන්වහන්සේගේ ගෝලයෙක්ද, යන්න නොව, ඔබ නිවැරැදි බවට ඔබ තුළ ඇති විශ්වාසය පමණි. ලොව්තුරා ධර්මය කරෙහි, ඔබ කරෙහි ඔබ විශ්වාසය තබන්න. අවශ්‍ය වේලාවට කල්‍යාණ මිත්‍රයකුගනේ, ගුරුවරයකුගනේ අවශ්‍ය උපදසේ ලබාගන්න.

තමාගේ ආරක්ෂාවට අවශ්‍යම මොහොතේදී පමණක් භාවිතයට තරුවන් වඳින ගාථා තුනක්, කරණීයමත්තෙන සූත්‍රයත්, කන්ද පිරිත්ත ඔබ අර්ථ වශයනේ දැන සිටියොත්, එය හොඳටම ප්‍රමාණවත්ය. ඉතිරි සියල්ල ඔබ අතහරින්න, අත්හැරීමේ ප්‍රමාණයට ඔබට නිවන් මග වැඩීම පහසුකරගත හැක. අන් සියල්ල ඔබ අතහැරීමට දක්ෂ වූයේ නම් පමණක්, ඔබ දැන් නිවන් මහෙයුමට සූදානම්ය.

හැබැයි මේ වන විට ඔබ ළඟ පාවිච්චියට මුහුණ බලන කණ්ණාඩියක්, උණුවතුර බෝතලයක්, ශීතලට පොරොවන පරෝණයක්, මේ වගේ දේවල් තිබුණොත් ඔබ තවම සූදානම් නොමැති බවයි පතෙන්නේ. මොකද මේ සියල්ල තුළ තිබන්නේ "මගේ කයේ සැප" පිළිබඳ චේතනාවයි. සියල්ල අතහරින්න. එතකේ ඔබ සූදානම් නොමැත. මුහුණ බලන කණ්ණාඩිය අතහැරීමට බැරි කනෙකුට කය

අතහැරීමට කිම විහිලුවකි. අනිවාර්යයනේම ඔබට හැකිය. ඔබ නැවත නැවත බුදු සම්දුන් සිතින් මවාගන්න. ඔබේ හදවතට වඩම්මවාගන්න. නිරතුරුව ඔබ උන්වහන්සේගේ සවෙණහෙි සිටින බව දකින්න. ඔබ හිමිදිරියේ පිණ්ඩපාතය වඩින විට ඔබ ඉදිරියනේ බුදු සම්දුන් වඩිනා බව දකින්න. සැරියුත්, මුගලන්, ආනන්ද මහෝත්තමයන් වහන්සේලා සිතින් මවාගනෙ ඒ උතුමන් සමඟ සිතින් ජීවත්වන්න.

උන්වහන්සේලා සමඟ හදවතින් මුමුණන්න. උන්වහන්සේලාගේ ඇවැතුම් පැවැතුම් ඔබේ ජීවිතයට එකකරගන්න. උන්වහන්සේලා නිවන් අවබෝධ කරගැනීමට ගත් වරෙ වීරිය මනසින් දකින්න. චක්ඛුපාල මහරහතන් වහන්සේගේ උත්සාහය සිතින් මවාගන්න. ඉහත උපකරම භාවිතකොට ඔබ නිවන් මහෙයුමට සිත පුරුදු කරගන්න. මාර බැම් එකිනකෙ කඩාදමම්න්ද, අත්හළයුතු දේවල් අත්හරිම්න්ද ඔබ සූදානම් වන්න. හැබැයි ඔබ ලෝකයා ඉදිරියේ රහතන් වහන්සේ කනෙකු ලසෙ හැසිරනේන එපා. එවිට ඔබ වැටනේනේ මාරයාගේ මල්ලටය. ස්වභාවධර්මයත් ඔබත් දකෙක් නොව එකක් බවට පරිවර්තනය කරගන්න දක්ෂවන්න, ඔබ ඉදිරියේ තිබනො රූස්ස ගසත් ඔබේ කයත් සංසන්දනය කොට බලන්න. දකෙම ධාතූන්ගේ විවිධත්වය පමණක් බව දකින්න.

ඔබ නැවතත් හිතන්න, ඔබ තවම මඟ වැඩීමට සූදානම් වන භික්ෂුවක් පමණයි. ඔබ හැකිතාක් විවේකීව සිටින්න. දිනකට මඬේචර වේලා භාවනා කළ යුතුයි, රාත්රි නිදවරා භාවනා කළ යුතුයි යන සිතිවිලි අනිත්ය වශයනේ දැක අයින් කරන්න. ඔබ අධිෂ්ඨානයක් ඇතිකරගන්න. මා ප්රාර්ථනා කරන්නේ, වීර්ය වඩන්නේ මාගේ අවසන් හුස්ම මේ කයනේ පිටවන මොහොතේ කිසිම ඇලීමක්, බැඳීමක්, ගැටීමක් නැතිව පිටකිරීමට පමණක් බව සිහිකරන්න. මොන හේතුවක් නිසාවත් සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරහත් මාර්ග ඵල ගැන නොසිතන්න. ඒවා කළෙසේ ධර්මයත් බව සිතන්න. මාර්ගඵල වලට ඇති ආශාව අතහරින්න. ඔබ මාර්ග ඵල තණ්හාවනේ අනාගාමී වීමට ගියහොත් ඔබේ වටිනා ජීවිතය Zඅනාගන්නාZ බව සිතන්න. විවේකීව සිතන්න. නිදිමතනම්

නිදාගන්න. සරළව, පහසුව, නිදහස්ව සිටින්න. ඔබ මේ ආකාරයේ ප්‍රතිපදාවක යදෙනෙ බව කිසිවකුට නොහඟවන්න. ඉන්ද්‍රියයන් හයට ඵස්ස වන සෑම රූපයක්ම අනිත්‍ය වශයනේ දකිමින්, සිතන්, කයන්, පරිසරයන් සමග නොගැටී සිතන්න.

ඔබ නිරතුරුවම සිතන්න, ඔබ මේ සටන් කරන්නේ මාරයා සමඟ බව. ඔබට අවශ්‍ය සෑම වේලාවකම මාරයාව රවටන්න. බිය ගන්වන්න. තැති ගන්වන්න. ඔබට මුලින් කිවනේ අරිහන් උතුමන් සමග මනසින් ජීවත්වන්නටය කියලා. ඒ මාරයාව රවටවන්න කරන දේවල්. දැන් ඔබ මාරයාව තැති ගන්වන්න. ඒ අරිහන් උතුමන්ද අනිත්‍ය බව දකින්න. ඒ උතුමන්ගේ පිරිනිsවීම මනසින් දකින්න. එම ධාතූන් වහන්සේලාගෙන් ගොඩනැගුණුqqq ස්ථූපයන් දකින්න. ඒ ද විනාශ වන බව මනසින් දකින්න.

දැන් නැවතත් ඔබ මාරයාව රවටන්න. රුවන්වැලි මහාසෑය, කිරිවහෙරෙ මහාසෑය, ජයසිරිමා බෝ සමි¹ණන්, දන්ත ධාතූන් වහන්සේ සිතින් මවාගනෙ සාධුකාර දනේන. දැන් නැවත මාරයාව තැතිගන්වන්න. ඉහත වන්දනීය පූජනීය වස්තූන්ද කාලගුණික, දේශගුණික, යුදමය හේතූන් නිසා විනාශ වී යනවා දකින්න. මේ සියල්ලේම අනිත්‍ය බව දකිමින් ඔබේ ආධිපත්‍යය මාරයා මත ටිකනේ ටික පටවන්න.

ලෝක ධාතුවේ හැමදයෙකම අනිත්‍යය ඔබ මනසින් දැක මාරයාව කම්පා කරවන්න. තැතිගන්වන්න. දැන් ඔබේ රාජකාරිය මයෙම විය යුතුය. සාරාසංඛය කල්ප ලක්ෂ ගණනාවක සිට ඔබව මුළා කරමින්ද, සතර අපායට, මනුෂ්‍ය, දිව්‍ය ලෝකවලට ගාල් කරමින්ද, ඔබ කරෙහි ආධිපත්‍යය පැතිරූ මාරයාට ටික ටික රිදවන්න.

බොක්සිං තරගයකදී ප්‍රතිමල්ලවයාට සමේන් සමේන් පහරදමේන්ද, උපක්‍රමශීලීව පහරදමේන්ද ප්‍රතිමල්ලවයා හමේබන්කොට අවසාන මරු පහර කිහිපයකින් ඔහුව බිම දමන්නා සේ, ඔබද මාරයාව උපක්‍රමශීලීව

රවටන්න. ඔබේ ඉන්ද්‍රියයන්ට ගෝචර වන සෑම රූපයක්ම අනිත්‍ය වශයෙන් දකින්න. දකින රූප මගහරින්න එපා. රූප බලන්නේ සොයා යන්නත් එපා. ඔබ වේගවත් ද මන්දගාමීද නොවන්න. ඔබේ ස්වභාවය තුළම ඔබ කටයුතු කරන්න. දැන් මොන මාර්ගඵලයකද ඉන්නේ, තව කොච්චර කල් යයිද? මට පුළුවන් වයෙද?.....

මේ මාර සිත් ඇතිවන මොහොතේම අනිත්‍ය වශයෙන් දැක පරාජය කරන්න. ගැටෙන්න එපා. රූපයක් දුටු සැණින් එය අනිත්‍ය වශයෙන් දකින්න. නැවත නැවත එම රූපයට ඇලීමක් ඔබ තුළ ඇතිවන්නේ එම රූපය විනිවිද දකින්නට උත්සාහගන්න. එහමෙ කළොත් ඔබේ පරතිඵල ඉක්මන් වේවි. අදාළ රූපය සුරූපිs කාන්තා රූවක් කියා සිතන්න. ඔබ ඇය මව්කුසේ සිටිනවා දකින්න. ඉස්ගඩෙයකේa ලසෙින් පටන්ගනෙ, නව මාසයක් බැලුම් බෝලයක් වැනි මව්කුසේ විඳි අන්ත වේදනා, මර ළතෝනි දිගනෙ ලෝකයට බිහිවන, මළ මූත්‍රා ගොඩේ දඟලන ළදරු වයස.....

ළමා, තරුණ, මධ්‍යම, මහලු වශයෙන් එම රූපය දකින්න. ඔබ දුටු ලස්සන රූපය ඇටසැකිල්ලක් කර දකින්න. එම ඇටසැකිල්ල බඩවැල්, නහර, මස් එල්ලාගනෙ සිටින ස්වභාවය දකින්න. මහුගේ හෝ ඇයගේ රූපය මනසින් නිරුවත්කොට සම්, මස්, නහර විනිවිද ගොස්, සම නමැති උරයට පුරවා ඇති ජරාගොඩ දකින්න.

ලස්සන තිබුණේ සුරූපී ඇය තුළ හෝ මහු තුළ නොව, තමාගේ අවිද්‍යාවනේ පිරුණු අනිත්‍ය වන සිත තුළ බව සිහිනුවණින් දකින්න.

පංච උපාදානස්කන්ධය, සප්ත බොජ්ඣංග, පටිච්ච සමුප්පාදය, සතර සතිපට්ඨානය ධර්මතාවන් ගිරවුන් මනේ කටපාඩම් කරන දේවල් නොව, ඔබ, රූපයේ අනිත්‍ය බව දකිමින්, පරඥාවනේ තීව්‍රර වන විට ඔබ ලබන අවබෝධය තුළ නොදැනුවත්වම ඔබට වැඩනෙනේ ඉහත ධර්මතාවන් බව සිතන්න.

ඔබ තවම සිටින්නේ පුහුණු මඩිටමකය. තවම තරගය පටන් ගත්තේ නැත. තවම ඔබ තරගයට මුහුණ දීමට ඇඟ උණුසුම් කරනවාය. ශක්තිමත්ව උණුසුම් වන තරමට තරගයට ජවය ලැබේ. මයෙ මුළු ලෝක ධාතුව තුළම තම ආධිපත්‍යය පතුරුවාගනෙ සිටින මාරයාට එරහෙව කරන සටනකි. තරගයකි. තරගයනේ ඔබ දිනුවොත් ඔබ ලෝකයෙන් එතරෙට යන කනෙකේය. ඔබ මේ යදේ සිටින්නේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේලා, පසේබුදුරජාණන් වහන්සේලා, අරිහත් උතුමන් උත්තමාවියන් තරගකොට ජයගත් තරගයකටය. මේ තරගයනේ රාහුල, සෝපාක, නිග්රෝධ වැනි දරුවන්ද ජයගනෙ ඇත. පටාචාරා, ඉසිදාසි වැනි කාන්තාවන්ද ජයගනෙ ඇත. පුහුණුව සාර්ථක නම් ජයග්රහණය ස්ථිරය.

ඔබ සරළ වන්න. සැහැල්ලු වන්න. නිදහස්ව සිටින්න. අවශ්‍ය වේලාවේදී පැන් පහසු වන්න. පොරවන සිවුර දහඩිය ගඳ නම් සෝදගන්න. කුටිය මිදුල පිරිසිදුව තබාගන්න. අනිත්‍ය දකිනවා කියා අපිරිසිදුකම ළඟට නොගන්න. අනිත්‍ය දකිනවා කියා ඔබ අපිරිසිදුකම ළඟට ගත්තේ නම් ඔබ දකින්නේ මුස්පේන්තු අනිත්‍යයකි. එය මාර බලයකි. ඔබ එය පරාජය කරන්න. ඔබ මධ්‍යස්ථ වන්න. අසුභය දැකීමට නම් සාපේක්ෂව ලස්සන සහ පිරිසිදු බව තිබිය යුතුය. ඒ ලස්සනට නොඇලීමට ලස්සන ඔබේ කර නොගැනීමට ඔබ ශක්තිමත් විය යුතුය. මේ ලෝකයේ සියලුම ලස්සන රූප ඔබේ කමටහන් විය යුතුය. හින්දි සිනමාවේ සුරූපීම නිලියන් වැඳිරියක්, ඇටසැකිල්ලක් සේ දැකීමට ඔබට හැකි විය යුතුය. ඒ අවස්ථාව ඔබට ලැබුණේ ඇය සුරූපී වූ නිසාය. ලස්සන නොමැති ලොවක ඔබට අසුභය වැඩිය නොහැක. අවලස්සන බවට යමක් පත්වන්නේ ලස්සන තිබුණහොත්ය. මන්ද ලස්සන අනිත්‍ය වී අවලස්සන ඇතිවන බැවිනි. මේවා ලෝකයේ ස්වභාවයන්ය.

ඔබ මසෙේ අවංකව, වීර්යවන්තව ප්‍රතිපදාවේ යදේි සිටින විට ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ඔබේ හදවතට වඩිවි. මොකද දැන් ඔබේ හදවත හැබෑ බුදුකුටියක් නිසා. උන්වහන්සේ ඔබට කියාදනෙු

ඇත. ඊළඟට ගතයුතු මඟ සංඥා වශයෙන් ඔබට වැටහෙනු ඇත. මෙවිට ඔබ සද්ධන්න හස්තිරාජයකුු සේ වීර්යයෙන් නැඟී සිටීවි. ඇයි දන්නවද? ඔබට ප්‍රත්‍යක්ෂ වශයෙන් වැටහෙනෙවා ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ඔබ ළඟ වැඩසිටින බව. ඔබට කමටහන් දෙන බව ඔබට වැටහේවි. මහිදී ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සහ නිවන් මඟ යනු දකෙක් නොව එකක් බව ඔබට වැටහේවී. නිවන් මඟ වඩන්න. බුදු සමි¹ණන් දකින්න.

මේ විශ්වාසය තුළ ජයග්‍රහණයේ දොරටුව ඇත. ඔබගේ උත්සාහයෙන් එය විවෘත කරගන්න. ඔබ දොරටුව විවෘත කර ගතහොත් ලෝකය තුළ ඔබ නිවනෙු ඇත. එවිට දෑස් පියාගත් සැණින් මුළු ලෝකයම නිරුද්ධ කර දැකීමට ඔබට හැකිය. ඔබට මේ ගමනේදී බුදුසමිඳුන්වත් අඵයික සංඥාවෙන් දැකීමට සිදු වනු ඇත. එයට ඔබ ශක්තිමත් වනතුරු කලබල නොවන්න. තවමත් ඔබට උන්වහන්සේගේ මඟ පෙන්වීම අවශ්‍යය. එනමේ ඔබ බුදුරජාණන් වහන්සේ මනසින් ඔබේ ආරක්ෂකයා වශයෙන් වැඩමවා ගන්න දක්ෂ වන්න. නිසි වේලාව පැමිණි විට ඔබගේ ශාස්තෘන්වහන්සේද අනහරින්න ඔබට අනිවාර්යයෙන්ම සිදු වේවි. මන්ද උන්වහන්සේ තුළද සත්ත්වයෙේ පුද්ගලයෙේ නොවන බව ඔබට අවබෝධ වන නිසාය.

(මා හට අහම්බයෙන් මුණගැසුණු, වනවාසී ස්වාමීන්වහන්සේ නමක්, මා වෙත ලබාදුන්, තම වනවාසී භික්ෂු ප්‍රතිපදාව තුළ ලද අත්දැකීම් සටහන් කළ පොත් කිහිපයක් ඇසුරින් මේ ලිපි මාලාව ඔබට ඉදිරිපත් කරමි).

ඉන්ද්‍රජිත් සුබසිංහ